## ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

## කොළඹ

***

## <u>පුවත්පත් නිවේදනය</u>

## සබඳතාවයේ ධනාත්මක පරිවර්තනයක ලක්ෂයක් : විදේශ ලේකම් විනේ ක්වාත්‍රා මහතා ශ්‍රී ලංකා ජනාධිපතිතුමාගේ ඉන්දියා සංචාරය පිළිබඳ අදහස් දක්වමින් පවසයි.

*(2023 ජූලි 11 වන දින ශ්‍රී ලංකා සංචාරය අතරතුර විදේශ ලේකම් විනේ ක්වාත්‍රා මහතා මාධ්‍ය අමතා පළ කළ අදහස්)*

.......... මාගේ මෙම ඉතා කෙටි සංචාරය අතරතුර අපට ළඟා කර ගන්නට හැකි වූ දේ පිළිබඳව ඔබ සමඟ බෙදා ගන්නම්. මා ශ්‍රී ලංකාවට පැමිණියේ ඊයේ රාත්‍රියේ දී. අද උදෑසන මා විදේශ අමාත්‍යතුමා, අතිගරු ජනාධිපතිතුමා සහ ශ්‍රී ලංකාවේ විදේශ ලේකම්තුමා හමු වුණා. දිවා භෝජනය අතරතුර අමාත්‍යවරු කිහිප දෙනෙකු හමුවීමේ අවස්ථාවත් අපට උදා වුණා.

මගේ සංචාරයේ අරමුණ, විශේෂයෙන්ම, ශ්‍රී ලංකා ජනාධිපතිතුමාගේ ඉන්දීය සංචාරයට අවශ්‍ය කටයුතු සූදානම් කිරීමයි. අද උදෑසන ශ්‍රී ලංකා නායකත්වය සහ විදේශ අමාත්‍යාංශය සමඟ මාගේ සාකච්ඡාවන්හිදි විශේෂයෙන්ම අවධානය යොමු කෙරුණේ ඉදිරියේදී සිදු වීමට නියමිත ශ්‍රී ලංකා ජනාධිපතිතුමාගේ සංචාරය සැබවින්ම සම්බන්ධතාවයේ ධනාත්මක පරිවර්තනයක ලක්ෂයක් වන බව සහතික කිරීම සම්බන්ධයෙනුයි . එම සංචාරයට පෙර අපට ඉදිරියට ගෙන යා හැකි ප්‍රධාන සහයෝගිතා අංශ,

සංචාරය පිළිබඳව කතා කිරීමේදී ශ්‍රී ලංකා නායකත්වයේ ප්‍රමුඛතා, සම්බන්ධතාවය පිළිබඳ අපගේ නායකත්වයේ දෘෂ්ටිකෝණය, සබඳතාවයේ ශක්තිය, සබඳතාවයේ සහයෝගීතාවයේ විවිධ අංශ, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින ආර්ථික සහයෝගීතාවයේ සමස්ත පරාසය තුළ ඉදිරි වසරවල අපගේ සහයෝගීතාවයේ විවිධ අංශ මෙහිදී සාකච්ඡා කළා.

මා පැවසූ පරිදි, ශ්‍රී ලංකා ජනාධිපතිතුමාගේ ඉන්දීය සංචාරය අතිශය සාර්ථක සංචාරයක් වන බව සහතික කිරීම අපගේ අරමුණයි. එතුමා හොඳින් දන්නා නායකයෙක් වගේම සම්බන්ධතාවයට ඉතා ශක්තිමත්ව උපකාර කරන නායකයෙක්. ශ්‍රී ලංකාව විවිධ අභියෝගයන්ට මුහුණ දුන් පසුගිය මාස 14-16 තුළ අපි ඉතා හොඳින් එක්ව සහයෝගයෙන් වැඩ කළා. එතුමාව ඉතා උණුසුම් ලෙස පිළිගැනීමට ඉන්දියාව සූදානමින් සිටින බව මට සහතික කරන්න පුළුවන්.

අතිගරු ජනාධිපතිතුමාගේ ඉන්දියානු සංචාරය අපි මහත් උනන්දුවකින් අපේක්ෂා කරනවා. එතුමාගේ සංචාරය සාර්ථක එකක් කිරීමට මෙන්ම අපගේ සම්බන්ධතාවය ද එවැනිම අයුරකින් සාර්ථක කිරීමට අප අපේක්ෂා කරනවා.

ඔබට බෙහෙවින් ස්තූතියි!

***

කොළඹ

2023 ජූලි 11